# <u>ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය මාතර දක්වා ව්‍යාප්ත කෙරේ</u>

2019 අප්‍රේල් 6 වන දින මාතර දිස්ත්‍රික්කයේ ඉන්දොළ වතුයායේ පවත්වන ලද විශේෂ උත්සවයකදී ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය යටතේ නව නිවාස 50 ක් ඉදිකිරීම සඳහා ඉන්දීය මහ කොමසාරිස් තරංජිත් සිං සන්ධු මැතිතුමා, මුදල් අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමා සහ උඩරට නව ගම්මාන, යටිතල පහසුකම් සහ ප්‍රජා සංවර්ධන අමාත්‍ය ගරු පලනි දිගම්බරම් මැතිතුමා විසින් මුල්ගල තබන ලදී.

පාර්ලිමේන්තු මන්ත්‍රීන්, දකුණු පළාත් සභාවේ සාමාජිකයින්, රජයේ නිලධාරීන් මෙන්ම වැවිලි මානව සංවර්ධන භාරයේ (PHDT) හා වැවිලි සහ වතු කළමනාකරණ නිලධාරීන්ද මෙම අවස්ථාවට සහභාගී විය. එසේම ඉන්දොළ වතුයායේ වෙසෙන විශාල පිරිසක්ද මෙම උත්සවයට සහභාගී වූහ.

මෙම අවස්ථාවේදී අදහස් දැක්වූ ඉන්දියානු මහ කොමසාරිස් තරංජිත් සිං සන්ධු මැතිතුමා ශ්‍රී ලාංකික ජනතාව සමෘද්ධිය සහ සංවර්ධනය කරා යන ගමනේදී ඉන්දීය රජය සහ ජනතාව ඔවුන් සමඟ සිටින බව අවධාරණය කළේය.

ඉන්දීය රජය විසින් වතුකරයේ ඉදිකිරීමට පොරොන්දු වූ නිවාස 14000 න් නිවාස 1000 කට වැඩි ප්‍රමාණයක ඉදිකිරීම මේ වන විට අවසන් කර ඇති අතර තවත් නිවාස 3000 ක් ඉදිකෙරෙමින් පවතී. ඉතිරි නිවාස ඉදිකිරීම සඳහා අවශ්‍ය ඉඩම් ශ්‍රී ලංකා රජය විසින් හඳුනාගත් පසු එම නිවාස ඉදිකිරීම ආරම්භ කෙරෙනු ඇත. මධ්‍යම සහ ඌව පළාත් ආවරණය කරමින් නුවරඑළිය, බදුල්ල, මහනුවර, මාතලේ සහ මොණරාගල දිස්ත්‍රික්ක වලද සබරගමු හා දකුණු පළාත් ආවරණය කරමින් ගාල්ල, මාතර, කෑගල්ල හා රත්නපුර දිස්ත්‍රික්ක වලද මෙම නිවාස ඉදිකෙරෙනු ඇත.

මෙම නිවාස අයිතිකරුවන් මූලික කරගත් නව්‍ය ක්‍රියාදාමයක් යටතේ ඉන්දියානු රජය වෙනුවෙන් UN Habitat, ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය (IFRC), ශ්‍රී ලංකා රතු කුරුස සංවිධානය (SLRC), Habitat for Humanity – Sri Lanka සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යන ස්වාධීන නියෝජිතායතනයන්ගේ තාක්ෂණික සහය මත ඉදිකෙරේ. ඉන්දොළ වතුකරයෙහි නිවාස ඉදිකිරීමේ නියෝජිතායතනය වන්නේ ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය / ශ්‍රී ලංකා රතු කුරුස සංවිධානයයි.

මෙම ඉන්දියානු නිවාස ව්‍යාපෘතියට අමතරව ගාල්ල, මාතර සහ හම්බන්තොට යන දිස්ත්‍රික්ක ආවරණය කරමින් දකුණු පළාතේ ආදර්ශ ගම්මාන 50 ක තවත් නිවාස 1200 ක් ඉදි කෙරෙමින් පවතී. ඉන්දියානු ආධාර යටතේ ක්‍රියාත්මක 1990 හදිසි හදිසි ගිලන් රථ සේවාව ප්‍රථමයෙන්ම ක්‍රියාත්මක කරන ලද්දේ දකුණු හා බස්නාහිර පළාත්වල වන අතර එහි ඉමහත් සාර්ථකත්වය නිසා එය දිවයින පුරා ව්‍යාප්ත කරන ලදී.

විශාලතම විශ්ව විද්‍යාල ශ්‍රවණාගාරය වන මාතර, රුහුණු විශ්ව විද්‍යාලයේ ශ්‍රවණාගාරය ඇතුළුව සෞඛ්‍ය, අධ්‍යාපනය, නිවාස, නිපුණතා සංවර්ධනය, යටිතල පහසුකම්, වෘත්තීය පුහුණුව ඇතුළු 70 කට අධික ජනතා කේන්ද්‍රීය ව්‍යාපෘතීන් ඉන්දියාව විසින් දිවයින පුරා දැනටමත් සම්පූර්ණ කර ඇති අතර තවත් එවැනි ව්‍යාපෘති 20 ක් මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. ඉන්දියාව මේ දක්වා ශ්‍රී ලංකාවට සංවර්ධන ආධාර වශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 3 කට ආසන්න ප්‍රමාණයක් ලබා දී ඇත. එයින් ඇමරිකානු ඩොලර් මිලියන 560 ක්ම නැවත නොගෙවිය යුතු ප්‍රදානයන් වේ.

*****

කොළඹ

2019 අප්‍රේල් 6